# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2193/51 - 2020 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : MTR/LND/LI/ACQUI/3999.
ඉ.අ. යොමු අංකය : 4-3/9/2017/ඩබ්ලිව්එස්/543.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වේරගම්පිට ග්‍රාම නිලධාරී වසමේ වේරගම්පිට ගමේ පිහිටි මු.පි. මාර/2836 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන මතු සඳහන් ඉඩම මාතර IV වන අදියර ජල යෝජනා ක්‍රමය යටතේ නිල්වලා ගඟ හරහා ලවණ බාධකයක් ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කරගනු ලැබේ.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: මතුගලකුඹුර; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; ඉඩමේ හිමිකම් කියන්නා: ලීලසේන දළදාවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0759.

ඉහත සඳහන් ඉඩමට / පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 ඔක්තෝබර් මස 09 වැනි දින පෙරවරු 10.30 ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ඔක්තෝබර් මස 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2020 සැප්තැම්බර් මස 10 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 135

1A - G 32927 - 30 (2020/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : අඹකෝ/3/7/අ/03.
ඉ.අ. යොමු අංකය : 4/3/15/2016/වීර්/255.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 319 එච් නිව් වැලිගම ග්‍රාම නිලධාරි වසමේ නිව්වැලිගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද 2020.07.17 දිනැති නු. 3401 හි කැබලි අංක 01 වශයෙන් සඳහන් හෙක්ටයාර් 0.5677 ක් පමණ වූ ග්ලැන්කන් වත්ත නැමැති ඉඩම් කොටස.

01. කැබලි අංක 01 - ඉඩමේ නම: ගැලැන්කන් වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; ප්‍රමාණය: 0.5677.

මායිම්
උතුරට: හි.පි. 58903 සහ මූ.පි. 3093හි කැබලි අංක F24; නැගෙනහිරට: හි.පි. 58903 සහ මූ.පි. 3093හි කැබලි අංක F24 සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: හි.පි. 58903 සහ මූ.පි. 3093හි කැබලි අංක F24; බටහිරට: හි.පි. 58903.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 දෙසැම්බර් මස 28 වැනි දින පෙ.ව. 10.00 ට අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 දෙසැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2020 සැප්තැම්බර් මස 16 වැනි දින,
අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 136

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : 11/3/3/1/34.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : LD/05/2009/MV/135A.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ E402C වැලිවරණාගොල්ල වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2020.07.29 දින සම්මත කරන ලද, භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 20හි, අතුරු පිඹුරු අංක 186හි, පත්‍ර අංක 259 දරන සැලැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.2521ක් වන පහත විස්තර සඳහන් ඉඩම්.

01. **කැබලි අංක 9281**
ඉඩමේ නම: ඇඳගල; විස්තරය: කාර්යාලීය වත්ත; හිමිකම් කියන අය: රජය, අංක එල් එල් 366 බලපත්‍රය යටතේ වැලිවරණාගොල්ල පදිංචි ලොකුගේ චමින්ද ජයසූරිය යන අය විසින් භුක්ති විඳී; ප්‍රමාණය: 0.2521

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 .................. වැනි දින අනුව පෙ.ව. ............... ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ............................. වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.